# අධ්‍යයනාංගයක් ලෙස ලෝකය වැළඳගත් විශ්ව සාහිත්‍යය



David Damrosch
Franco Moretti

දහ නව වන සියවස පුරාවට පැතිරී විසිවෙනි සියවසට කිමිදෙමින් යලි නැගුනු ජාතිකත්වයේ දිය කඳ, විශ්ව සාහිත්‍යය පිළිබඳ තිබූ දැඩි උනන්දුවට අඳුරු යුගයක් රැගෙන ආ නමුත් පශ්චාත් යුධ සමයේ ඇමරිකාව තුල, විශ්ව සාහිත්‍යයයේ හා තුලනාත්මක සාහිත්‍යය ක්‍රමයක පුනර්ජීවයක් ඇතිවන්නට පටන් ගෙන තිබුනේ නිරායාසයෙන් මෙනි.

ලෝකයේ කලක් තිස්සේ ස්ථාපිත වූ රටවල් හා සැසඳීමේදී, ඇමරිකා එක්සත් ජනපදය හැඳින්විය හැක්කේ සංක්‍රමණිකයන්ගේ දේශයක් ලෙසත් ප්‍රතිශ්ඨිත ජාතිකත්වයක් හා සංස්කෘතියක් නොමැති රටක් ලෙසත්ය. එම හේතුව නිසාම විශ්ව සාහිත්‍යයයට තුලනාත්මක/සන්සන්දනාත්මක සාහිත්‍යය පිළිබඳ අධ්‍යනයට එක්සත් ජනපදය මහඟු තෝතැන්නක් බඳු විය.

ග්‍රීක හා රෝමානු සම්භාව්‍ය සාහිත්‍යය හා බටහිර යුරෝපයේ බලවත් රටවල අධ්‍යතන නිර්මාණයන් කෙරෙහි ලොව වටා කලාකාමී බුද්ධිමතුන්ගේ වැඩි අවධානයක් යොමුව තිබුනද 1980 අග භාගයේ හා 1990 මුල් භාගයේදී ඒකරාශී වූ විවිධ සාදක රැසක් මුල්කොටගෙන විශ්ව සාහිත්‍යය සංකල්පය ලෝකය වෙත පුළුල්ව විවර වී ව්‍යාප්ත වන්නට විය. එක්සත් ජනපදයත් සෝවියට් සමූහාන්ඩුවත් අතර පැවති බල අරගලයේ නිමාවත් සමඟම ඇති වූ ගොලීයකරණය හා ලොව විවිධ දිශාවන්ගෙන් ඇති වූ සංක්‍රමණයන් හේතුවෙන් ලෝක සාහිත්‍යය අධ්‍යනය කළයුතු විෂයයක් ලෙසද ජනප්‍රිය වන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස 1956 බටහිර යුරෝපීය හා උතුරු ඇමරිකානු උසස් සාහිත්‍යය නිර්මාණ ඉස්මතු කරමින් ප්‍රකාශයට පත් කෙරුනු නොදර්න් ඇන්තොලොජි ඔෆ් වර්ල්ඩ් මාස්ටර්පීසස් (Northern Anthology of world masterpieces) ග්‍රන්තය 1995 දී බටහිර නොවූ සාහිත්‍යය නිර්මාණ රැසක් හා එම ග්‍රන්ථ නාමයෙහි කුඩා වෙනසක් සමඟ යළි මුද්‍රණය කෙරුණි. මේනාඩ් මැක් සහ සේරා ලෝවල් විසින් ප්‍රකාශිත එම දෙවන සංශෝදනය හඳුන්වන ලද්දේ නොදර්න් ඇන්තොලොජි ඔෆ් වර්ල්ඩ් ලිට්රේචර් ලෙසයි. (Northern Anthology of world literature; Maynard Mack and Sarah Lawall, Expanded Edition, 1995) මෙසේ නෝටන්, බෙඩ්ෆෝර්ඩ් හා ලෝග්මන් වැනි ප්‍රකාශිකයන් විසින් ප්‍රකාශිත එබඳු ගවේශනාත්මක ගද්‍ය හා පද්‍ය සංග්‍රහයන් ඇතුලු ලෝක පූජිත අනෙකුත් ගද්‍ය හා පද්‍ය සංග්‍රහන් රැසක් මගින් මේ වනවිට රටවල් දුසිම් ගණනක සිය ගණනක වූ විශිෂ්ඨ ලේඛකයන් විශ්ව සාහිත්‍යය කරළියට හඳුන්වා දී ඇත.

මෙම අලුත් ප්‍රබෝධය හේතුවෙන් විවිධ සංස්කෘතික පසුබිම්වල සිට කරනු ලැබූ අධ්‍යයනයන් මගින් නොයෙකුත් සෛද්ධාන්තික සාහිත්‍යමය ප්‍රත්‍යයන්ටද ප්‍රභාලෝකයක් සැපයෙන ලදී. ප්‍රමාණයෙන් අතිවිශාල නොවුනත්, විශ්ව සාහිත්‍ය නිර්මාණ ලොවතුළ පැතිරයාමේ හා පිළිගැන්වීමේ බරපතල දුෂ්කරතා පැවති බව ඩේවිඩ් ඩම්රොෂ්ච් (David Damrosch )" 2003 ප්‍රකාශයට පත් කෙරුන ඔහුගේ 'ලෝක සාහිත්‍යය යනු කුමක්ද ?' (What is world literature ?) නම් ග්‍රන්ථය තුලින් විවාදයට බඳුන් කරයි. විශ්ව සාහිත්‍යය නිර්මාණ වශයෙන් පිලිගැණුන නිර්මාණ සැබැවින්ම උසස් මට්ටමේ ඒවා වන බවත් විවිධාකාර වූ පරිවර්ථන හරහා ඒවා තවතවත් වටිනාකමින් ඉහළ ගිය බවත් ඩම්රොෂ්ච් එම ග්‍රන්ථයෙන් තවදුරටත් අවධාරණය කරයි. ඔහුගේ කියවීම් බෙහෙවින්ම සිදුවූයේ ඒ ඒ නිර්මාණ වෙන් වෙන් වශයෙන් නිරීක්ෂණය කිරීමෙන් වන අතර, ස්ටැන්ෆෝර්ඩ් ප්‍රකාශකයිනගේ නිපුණ විචාරකයෙකු වූ ෆ්රැන්කො මොරෙට් (Franco Moretti) ඔහු ලියූ 'විශ්ව සාහිත්‍ය පිළිබඳ අනුමාන (Conjectures on World Literature) නම් ලිපි දෙකක තර්ක කරනුයේ, විශ්ව සාහිත්‍යය නම් වූ 'කෝදුව' සම්ප්‍රදායික සමීප කියවීම්වලින් ග්‍රහණය කරගත හැකි සීමාවෙන් ඔබ්බට විහිදී ඇති හෙයින් උසස් නිර්මාණ හඳුනා ගැනීමේ ක්‍රමවේදය වියයුත්තේ මහා පරිමාණයෙන්, දුරස්ත කියවීමක යෙදී ලෝකය පුළුල් ලෙස හා විවිධ ස්වරූපයන්ගෙන් දැකිය යුතුවන බවයි. කවිය, ගීතය, සංගීතය, කෙටිකතාව, නවකතාව, සිනමාව, වේදිකා නාට්‍යය, ඔපෙරා, බැලේ ආදී විවිධ ස්වරූපයන්ගෙන් කලාව හඳුනාගන්නා පුද්ගලයා සාහිත්‍යයමය වශයෙන් පිරිපුන් වන්නේයැයි මොරෙට් විශ්වාස කරයි.

විශ්ව සාහිත්‍යය නම් වූ විසල් පථය ගයත්‍රී චක්‍රවෝර්ති ස්පිවක් (Gayatri Chakravorty Spivak) වැනි විචාරකයින්ගේ විවාදයන්ට හා සාකච්ඡාවන්ට තුඩු දෙමින් තවදුරටත් වර්ධනය වෙමින් පවතී. ස්පිවක්ට අනුව නම් පරිවර්ථනයක් සැම විටම මුල් නිර්මාණයේ ඇති බසෙහි තීව්‍ර බව මටසිලුටු කරනවා පමණක් නොව එහි ඇති පිරිපුන් බව හා දේශපාලනික සංදර්භයද තරමක




දුර්වලත්වයකට පත්කරනු ලබයි. එතෙර රටවල විවිධ මාණයන් ඔස්සේ කුමණ ආකාරයකට කලාව හා සාහිත්‍යය ගමන් කළද, විශ්ව සාහිත්‍යය යන්න පිළිබඳ අධ්‍යයනය කිරීම, ස්වකීය බසකින්, දේශීය සංදර්භයන් තුල සිට කෙරෙන සමීප කියවීම් තුලින්ම වුවද තවදුරටත් කලහැකි බව තවත් ප්‍රාඥයන් කොටසක් විශ්වාස කරයි.

කලකදී යුරෝපා සහ ඇමරිකානුවන්ගේ මූලික අවධානයට පමණක් බඳුව පැවති විශ්ව සාහිත්‍යය, මේ මොහොත වන විට සාකච්ඡාවට හා සම්මන්ත්‍රණයට නිතර බඳුන්වන අධ්‍යයනාංගයක් ලෙස ලොව පුරා ප්‍රචලිත වී ඇත. 2011 චීනයේ පීකිං විශ්ව විද්‍යාලයෙන් ඇරඹි විශ්ව සාහිත්‍යය පිළිබඳ කෙටි පාඨමාලාවන් 2012 දී ඉස්තාන්බුල් හි බිල්පි විශ්ව විද්‍යාලයටත් 2013 දී හාවර්ඩ් විශ්ව විද්‍යාලය දක්වාත් ව්‍යාප්තව ගොස් තිබුණි.

මෙම දශකයේ මුල් භාගයේ සිට අඛණ්ඩව ගලායන දිය දහරාවක් බඳු වූ සාහිත්‍යය නිර්මාණයන්, විශ්ව සාහිත්‍යයේ අතීතය පිළිබඳ සෙවීමටත් වර්තමාණ කියවීම සාකච්ඡාවට බඳුන් කිරීමටත් ඇවැසි සරු බිමක්, අනාගත පරපුර වෙනුවෙන් දැනටමත් සපයා දී තිබේ.

විශ්ව ඥාණය ගවේශනය කරන්නන් මුණ ගැසෙන අන්තර්ජාලයද වරෙක ගුරුවරයෙක් වෙමින්ද තවත් වරෙක කලාගාරයක්, පුස්තකාලයක් හා විශ්ව කෝෂයක් වෙමින්ද උසස් නිර්මාණ රස විඳින්නට අද ලෝකයට ඉඩ හසර පාදා දී තිබේ. ඒ අනුව යමින් විශිෂ්ඨ නිර්මාණකරුවන් රැසක් සිය නිර්මාණ අන්තර්ජාලයට මුදාහරින්නට උනන්දුවන බවද පෙනේ. විද්‍යුත් මාධ්‍යයන් හරහා හැකිතාක් ලිවීම හා කියවීම කළහැකි බව මුලින්ම පෙන්වා දුන් අයෙක් වන්නේ සර්බියානු ජාතිකයෙක් වන මිලෝරඩ් පැවිස්ය එසකදරා ජ්ඩසර් :1929 - 2009*. පැවිස් එසේ මුද්‍රිත ලියන්නෙකු ලෙස නම් කෙරෙද්දී, ඇමෙරිකානු කොරියානු එකමුතුවක් වූ යං-හා-චෑංග්-හීවිය් සමාගම විසින් විවිධ භාෂාවන්ගෙන් සමන්විත වූ ඔවුන්ගේ සියලුම ප්‍රකාශනයන් අන්තර්ජාලය ඔස්සේ පමණක් බෙදාහරිමින් සිටියි.

දේශීය සාහිත්‍යය හා අත්වැල් බැඳගත් සහෝදරයෙකු මෙන් අද විශ්ව සාහිත්‍යය ලොව විවිද රටවල උසස් නිර්මාණයන් එකම වේදිකාවක් මතට ගෙන එමින් සිටියි; අනාදිමත් කාලයක් පටන් අද දක්වා පරිසරය හා බැඳුනු - නොබැඳුනු, සුන්දර වූත් අසුන්දර වූත් සිදුවීම්, ඉතා සංවේනාත්මක මතක මාත්‍රයන් සේ අපූර්වත්වයට පමුණුවමින් සිටියි. ඒ අපූර්වත්වය විඳගැනීමට මිනිස්වගට ආරධානා කරමින් සිටියි.

## VCE Chemistry 2014

Individual and Groups
Early completion of syllabus and Exam preparation
Home Visited

**Priyantha Liyanage**
0407664546

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර
**www.thisara.com**

# LANKAN AUTO CARE

**Licensed Roadworthy Tester (R.W.C)**



ALL MECHANICAL REPAIRS
LOG BOOK SERVICE | ELECTRICAL REPAIRS
AUTO TRANSMISSIONS | BRAKES & CLUTCHES
FUEL INJECTION | COMPUTER DIAGNOSTIC




Ranjith Perera
Mob: 0409 866 886

**9798 2200**

**14/30 Tower Court Noble Park 3174**